WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

**47 - සිංහල සාහිත්‍ය රසාස්වාදය**

ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| I | කොටස | - | 1, 2 ප්‍රශ්න අනිවාර්ය වේ |
| II | කොටස | - | 3 ප්‍රශ්නය අනිවාර්ය වේ |
| III | කොටස | - | කැමති ප්‍රශ්න 02ක් පමණයි |

| | | | | | |
|---|---|---|---|---|---|
| I | කොටස | - | 1 ප්‍රශ්නයට | - | ලකුණු 20 |
| | | | 2 ප්‍රශ්නයට | - | ලකුණු 25 |
| | | | | | ලකුණු 45 |
| II | කොටස | - | 3 ප්‍රශ්නයට | - | ලකුණු 25 |
| III | කොටස | - | එක් ප්‍රශ්නයකට 15 බැගින් ප්‍රශ්න 02කට | - | ලකුණු 30 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මුළු ලකුණු | - | I | කොටස | - | ලකුණු 45 |
| | | II | කොටස | - | ලකුණු 25 |
| | | III | කොටස | - | ලකුණු 30 |
| | | | | | ලකුණු 100 |

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ............................................................ ✓ $\frac{4}{5}$

(ii) ............................................................ ✓ $\frac{3}{5}$

(iii) ............................................................ ✓ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

WWW.OLEVELAPI.COM

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර X ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



# 47- සිංහල සාහිත්‍ය රසාස්වාදය

* I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න **දෙකකටත්** පිළිතුරු සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත ය. පළමු කොටසට ලකුණු 45ක් ද, දෙවන කොටසට ලකුණු 25ක් ද, තෙවන කොටසට ලකුණු 30ක් ද, බැගින් ලකුණු 100ක් ප්‍රදානය කෙරේ.

## I කොටස

සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කෘති කියවීම හා රස වින්දන හැකියාවත්, ඒවායෙහි සාහිත්‍යමය වටිනාකම් පිළිබඳ ශිෂ්‍යයින් ලබා ඇති අවබෝධයත්, මෙම ප්‍රශ්නවලින් පරීක්ෂා කෙරේ.

පළමු ප්‍රශ්නයට අදාළ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 20කි.

එක් අනුකොටසකට ලකුණු 02 බැගින් - ලකුණු 04කි.

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** ලියන්න.

(i) "මූ යන්ට අවසර නො ලද්දු නම් ළය පැළී මිය යන්නාහ. වන්නාට දැනට යෙත්ව"

(අ) මෙහි 'මූ' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?

(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කුමන අවස්ථාවක ද?

(අ) පබාවතී බිසව/ කුස රජුගේ බිසව/ මදු රද දූ/ ප්‍රභාවතී/ පබාවතී

(ආ) මඟුල් උයනේ දී (පොකුණේ දී) කුසරජු විරූපී අයෙකු බව නිශ්චිත ව හඳුනා ගත් පසු පබාවතිය නැවත මදු රටට යන්නට යාන වාහන සරසන ලෙස තමන්ට නියෝග කළ බව ඇමතිවරුන් විසින් කුස රජුට පවසන ලද අවස්ථාව

*ලකුණු 02 x 2 = 04යි*

(ii) "දරුපෙම් මුණුබුරුපෙම් ඇත්තේ මට මතු නො වන්නේ වේ ද කාටත් සරි ය."

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතියේ කතුවරයා නම් කරන්න.

WWW.OLEVELAPI.COM

(අ) සුද්ධෝදන රජු/ සුදොවුන් රජු/ බුදුරදුන්ගේ පියා/ නන්ද කුමරුගේ පියා/ රාහුල කුමරුගේ සීයා

(ආ) ධර්මසේන හිමි

*ලකුණු 02 x 2 = 04යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iii) "මෙහෙම ගියොත් අපට හෙටවත් යන්න වෙන්නේ නැහැ. ටිකක් ඉක්මන් කරපන්."
(අ) මෙම විධානය ලබන්නාගේ නම කුමක් ද?
(ආ) මෙම විධානය ශ්‍රවණය කරන තැනැත්තාගේ රැකියාව කුමක් ද?

(අ) ඉයෝනා පොටපොෆ්/ ඉයෝනා/ ඉයෝනා නමැති කරත්තකරු

(ආ) කුලී අශ්වරථ රියදුරු/ කුලී අශ්වරථ පැදවීම/ කුලී රථ රියදුරු

*ලකුණු 02 x 2 = 04යි*

(iv)
විපුල ගුණැති මහතුන් හට පත් විපත
නිසල නැණින් යුතු උතුමෝ ම දුර ලත
**කලල ගිලුණු** මත වරණිඳු ගොඩ ගනුත
**තුමුල බලැති** ගිජිඳකු මිස අන් කෙවත

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) මෙම කවියේ මුල් පද දෙකෙහි අදහස ලියන්න.

(අ) කලල ගිලුණු - මඩෙහි එරුණු/ මඩෙහි ගිලුණු

තුමුල බලැති - මහත් බල ඇති/ ඉතා ශක්තිමත්/ බොහෝ ශක්ති සම්පන්න/ බලසම්පන්න

(ආ) මහත් වූ ගුණ ඇති උත්තමයන්ට ඇති වන විපත තිරසර/ ස්ථිරසාර/ නිශ්චල/ නොසෙල්වෙන/ නුවණින් යුතු උත්තමයෝ දුරලති/ ඉවත් කරති/ නැති කරති.

*ලකුණු 02 x 2 = 04යි*

(v)
පැනැ-නැඟී අහසේ පැතිරී ගොසින්
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්
කුඹුරු-වැව්-පොකුණුත් පුරවා දියෙන්
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්

(අ) "මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්" යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.
(ආ) මෙහි 'ඔබ' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කවරෙකුට ද?

(අ) මහා ග්‍රීස්මය/ විඩාව/ වෙහෙස නැති කොට/ දුරු කොට/ දුරලා සත්ත්වයාගේ සිත සතුටු කර

(ආ) වැහි වලාකුළට

*ලකුණු 02 x 2 = 04යි*

*මුළු ලකුණු 04 x 5 = 20යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**2.** පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ    වේ
සුන්දරහාමි එතරම් පොහොසතෙක් නො    වේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැ    වේ
රත් වත් කරල් බරවී දැන් බිමට නැ    වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු    වර
තවමත් සිතේ ඇත අමතක නො වන    යුර
හේනට ගොසින් ගෙන් හුවක් තරම    දුර
එනවා දිටිමි මිටි බැඳ ගෙන වියලි    දර

දරටික තබා සෙවණැති පලු ගසක    යට
පිස දම දමා දාඩිය එන නළල    පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ    කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර    මට

පෙර දැක නොමැති මුත් සුන්දරහාමි    විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු    ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙම්බුල තැඹිලි    ගසින්
පිළිගැන්විය මට සොම්නස පිරුණු    ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි    වත්තේ
දූප්පත් කමයි හැම තැන ලකුණුව    ඇත්තේ
කෙලෙසද කියා කළ ගුණ සැලකිය    යුත්තේ
දුන් සත පනහවත් ඔහු නැත පිළි    ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු    නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය    සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය    තුතී
සිහිවී මගේ කම්මුල රතු පැහැය    ගතී

(i) මෙම පැදි පෙළට පාදක වී ඇති අත්දැකීම

නගරයේ සිට ගමට ගිය ආගන්තුකයෙකු ගැමියෙකුගෙන් ලැබූ සත්කාරයක්/ නගරයෙන් ගමට ගිය ආගන්තුකයෙකු ගැමියෙකුගෙන් ලැබූ සංග්‍රහයක්/ ප්‍රතිලාභයක් අපේක්ෂා නොකර ගැමියෙකු විසින් ආගන්තුකයෙකු වෙත දක්වනු ලැබූ සංග්‍රහය

*ලකුණු 05යි*

(ii) පද්‍ය පන්තිය නිර්මාණයේ දී කවියා යොදා ගත් බස් වහර

WWW.OLEVELAPI.COM

★ සරල බස් වහර

- ගන්තුන තුලානේ අලියා වැටුණු    වැවේ
- ඔහුගේ ගමට මා ගිය ඒ පළමු    වර

★ ගැමි බස් වහර

- ගෙන් හුවක් පමණ දුර
- තුන් ලාහකම බිම වැඩකර දියෙන්    වැවේ
- මා එන තුරුම සිට පෙන්වූ සිනහ    කට



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

★ අනුප්‍රාසාත්මක බස් වහර

- පිස දම දමා දාඩිය එන නළල පිට

*ලකුණු 05යි*

(iii) සුන්දරහාමිගේ දිවිපෙවෙත

සරල නිර්ව්‍යාජ දුප්පත් ගොවියෙකි.

දුප්පත් බව

- සුන්දරහාමි එතරම් පොහොසතෙක් නොවේ
- දර ටික තබා සෙවණැති පලු ගසක යට
- පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
  දුප්පත් කමයි හැම තැන ලකුණුව ඇත්තේ

නිර්ව්‍යාජ බව

- ආගන්තුක ව එන කෙනකුට පුරුදු නැති
  හිතවත් කමින් සැලකූ යුතුකමය සිතී
- මා එනතුරු ම සිට පෙන්වූ සිනහ කට
- දුන් සත පනහවත් නැත ඔහු පිළි ගත්තේ

*ලකුණු 05යි*

(iv) ආගන්තුකයන් කෙරෙහි දැක් වූ ග්‍රාමීය ආකල්පය

සුහද බව

- මා එනතුරු ම සිට පෙන්වූ සිනහ කට
- මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්

සංග්‍රහශීලී බව

WWW.OLEVELAPI.COM

- ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
  පිළිගැන්වීය මට සොමිනස පිරුණු ඇසින්

*ලකුණු 05යි*

(v) කවියා තමන් පිළිබඳ ලැජ්ජා වීම

සිහිවී මගේ කම්මුල රතු පැහැය ගතී

*ලකුණු 05යි*

(අනුඅංක රහිත ව රස වින්දනය ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න)

*මුළු ලකුණු 25යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**නැතහොත්**

පුතු ඉපදුණු මේ පොළොවේ
උරුමය පුතුටයි
ඒ පොළොවේ ඔද තෙද ගුණ
පුතුහට පිහිටයි

විහාර මහ මැණිවරුන්
ඉපදුණු පොළොවයි
මද්දුම බණ්ඩාර පුතුන්
ඉපදුණු පොළොවයි
රාසිහ මහසෙන් දෙවිඳුන්
ඉපදුණු පොළොවයි
මින් මතුවට ඒ පොළොවේ
උරුමය පුතුටයි

මහ සෑ රන් කොත මුදුනේ
ගන රන් කිරණයි
සිරිමා බෝ මැඩ සෙවනේ
සිහිලැල් පවනයි
දළදා හිමි රැඳි විමනේ
බුදුරැස් දහරයි
හැමදා හැම දුක් දුරලා
පුතු සිත සනසයි

සතර අතින් මුහුද නැඟී
පවුරු සදාලයි
වෙරළ දිගින් මුතු මතුවී
යසස උදා වෙයි
පොළොව පලා මිණි රුවනින්
ඉසුරු ගලා එයි
පොළොව එවන් පුතු උරුමෙන්
ලැබුව නිදානයි

(i) මෙම පද්‍ය පන්තිය නිර්මාණයේ දී කවියාගේ අපේක්ෂාව වූයේ කුමක් ද?

දැයේ දරුවන් කෙරෙහි දේශාභිමානය වර්ධනය කරලීම

*ලකුණු 05යි*

(ii) පුතුගේ සිත සැනසෙන්නේ කවර හේතු නිසා දැයි පැහැදිලි කරන්න.

- ★ ලක් පොළවේ ඔද තෙද ගුණයෙන්
- ★ ලක් පොළවේ උරුමය පුතුට හිමිවීමෙන්
- ★ මහ සෑ රන් කොත මුදුනේ ගන රන් කිරණින්
- ★ සිරිමා බෝ මැඩ සෙවනේ සිහිලැල් පවනින්
- ★ දළදා හිමි රැඳි විමනේ බුදුරැස් දහරින් ඇති වන ආගමික භක්තියෙන් පුතුගේ සිත සැනසීම යනාදි කරුණු විස්තර කළ යුතුයි.

*ලකුණු 05යි*



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iii) පුතුට ඉසුරු ලබා දෙන මූලාශ්‍රය කවරේ ද?

★ රට වටා පිහිටි මහමුහුදෙන් මුතු ලැබීම
★ මහපොළවෙන් මැණික් මතුකර ගැනීම

*ලකුණු 05යි*

(iv) තම අභිමතාර්ථය ඉටු කර ගැනීම සඳහා කවියා විසින් භාවිත අවස්ථා හා සිද්ධි අගයන්න.

කවියා තම අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා භාවිත අවස්ථා සහ සිද්ධි

★ විහාරමහාදේවිය, මද්දුම බණ්ඩාර, රාජසිංහ, මහසෙන් වැනි අතීත විරුවන් දේශාභිමාන වර්ධනය සඳහා සිහිපත් කිරීම
★ සිත සනසන ආගමික පරිසරය
  - රුවන්වැලි මහා සෑය
  - ශ්‍රී මහා බෝධිය
  - දන්ත ධාතූන් වහන්සේ

  ආශ්‍රයෙන් මතු කර ඇති බව පැහැදිලි කළ යුතු ය.

★ දේශයේ ආරක්ෂාව ස්වභාවධර්මය මගින් සුරැකෙන අන්දම
  - දිවයින වටා මුහුද ප්‍රාකාරයක් මෙන් පවත්නා බව

★ රටට සෞභාග්‍ය උදාකරන දුර්ලභ මුතු මැණික් වැනි සම්පත් ලැබීම
  මහමුහුදෙන් මුතු ද මහපොළවෙන් මැණික් ද ලැබීම යනාදි උදාහරණ ඉදිරිපත් කරමින් ඇගයීම කර තිබිය යුතු ය.

*ලකුණු 10යි*

*මුළු ලකුණු 25යි*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM



## II කොටස

- පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක කොටසකට පමණක්** පිළිතුරු සපයන්න.

**3.** "වහන්දෑ මෙ පවත් අසා 'නන්ද තෙරුන් වහන්සේ නම් බුදුන්ගේ කුඩා මෑණියන්දෑගේ පුත් සේක. මහණව කරන සංකමුත් ගෙය කඹුරන්නා සේ දෙවඟනන් නිසාල. එයිත් ඇපයකට නො නිසි බුදුන්ගෙන් ඇප ඇතිව ලැ'යි නන්ද තෙරුන් වහන්සේ ළඟට ගොසින් මෙ හැම කියා වෙහෙසන සේක.

නන්ද තෙරුන් වහන්සේ ද වහන්දෑගේ කතාවෙන් තරයේ ම ලජ්ජා ඇතිව දෙවඟනන් කෙරෙහි කළ ආලය හැරී, පෙරළි හන්ට තුබූ දෙයක් නො මෙහෙ ලෙස තනා තබා ගන්නා සේ පෙරළා මහණ දමට ම සිත්සතන් යොමු කොටලා රජ සිරි හැර අවුත් නිවන් සිරි නො වරදනා නිසා නො පමාව වසන සේක. යම් සේ ලේනෙක් තමා තරම් කෙනෙකුන් තමාට සතුරුව ආ කල තමාගේ නඟුට කුප්පවාලා එයින් ගසාලා පහ කෙරේ ද, එමෙන් ළං වූ කෙලෙස් සතුරු කෙනෙක් ඇත් නම් සතර සීවටන් නමැති මුගුරෙන් මරා පලවමින් යම් සේ දිවි දෙනෙක් කෙතෙක් වුවත් එක වරෙක වදනා පැටවුන් මුත් දෙවන මුරයේ නො වදා ද, එක මුරයෙන් ම වඳ වේ ද, එපරිද්දෙන් උපන් ජාති විනා භවෝත්පත්ති නැති වීමට අදහස් ඇතිව යම් සේ දිවියෙක් තණ කැළෑ ආදිය යට වැදලා හිඳ ගොදුරු අල්වා ගනී ද, එසේ ම අර්හත් ඵල නමැති ගොදුරු නිසා ගම්භීරාරණ්‍ය රුක් මුල්, ගල්පාවුළු, කඳුරැලි, ගල්ගුහා සොහොන අබවස යනාදියට එළඹ, යම් සේ දිවියා ගොදුරු අල්වා ගත් කලට වමැළැයෙන් හුණු ගොදුරු නො කා ද එ පරිද්දෙන් එක් විසි අන්වේෂණ වශයෙන් වේවයි' වාග් විඥප්ති වශයෙන් වේවයි, උපන් දෙයක් ඇත්නම් විෂ මිශ්‍රයක් පරිද්දෙන් හැර විදසුන් වඩා රහත් ඵල නමැති වොටුනු පැළඳීමෙන් හැර ආ රාජාභිෂේකයට රාජ්‍යාභිෂේකයක් ලදින් හැර පියා ආ ගෙමඟුලට නිවන් ගෙමඟුල් කොට හැර ආ විවාමඟුලට පලසමවත් විවාමඟුල් කොට, බුදුන් සන්තක නිවන් රට තමන් වහන්සේටත් හිමි කළ සේක."

(i) බුදුරජාණන් වහන්සේ හා නන්ද තෙරුන් වහන්සේ අතර තිබූ ඥාති සම්බන්ධය කුමක් ද?

- බුදුන් වහන්සේගේ කුඩා මෑණියන්දෑගේ/ සුළු මවගේ/ පුංචි අම්මාගේ පුත්‍රයා/ මලණුවන්/ මල්ලී

*ලකුණු 05යි*

(ii) අනෙකුත් භික්ෂූන් වහන්සේලා නන්ද තෙරුන් වහන්සේ වෙහෙසීමට පත් කළ ආකාරය පැහැදිලි කරන්න.

- බුදුන් වහන්සේගේ කුඩා මෑණියන්ගේ පුත්‍රයා වූ නුඹ, ඇපයකට නොගත යුතු බුදුන් වහන්සේත් ඇපයකට ගෙන, මහණදම් පුරනවා වෙනුවට දෙවඟනන් ලබාගැනීමේ අරමුණ ඇතිව ගිහියෙකු සේ කටයුතු කරනවා නොවේ ද?

(ඡේදයෙන් අදාළ කොටස උපුටා දක්වා තිබුණ ද ලකුණු ලබා දෙන්න.)

*ලකුණු 05යි*

(iii) නන්ද කුමරු බලාපොරොත්තු වූ රාජාභිෂේකය, ඔටුනු පැළඳීම, ගෙමඟුල හා විවාමඟුල රහත් භාවයට පත්වීමෙන් ඉටු කර ගත් අයුරු ඡේදයෙන් නිරූපණය කර ඇත්තේ කෙසේ ද?

WWW.OLEVELAPI.COM

- හැර ආ රාජාභිෂේකය වෙනුවට විදසුන් වඩා රහත්ඵල නැමැති ඔටුනු පැළඳ රාජාභිෂේකයක් ලැබීම, හැර පියා ආ ගෙමඟුලට නිවන් ගෙමඟුල් කරගැනීම, හැර ආ විවා මඟුලට පලසමවත් විවාමඟුල් කරගැනීම සහ බුදුන් සන්තක නිවන් රට තමන් වහන්සේටත් හිමි කර ගැනීම.

- අත්හළ රාජාභිෂේකය වෙනුවට - රහත්ඵල නැමති රාජාභිෂේකයට පත්වීම
- අත්හළ ගෙමඟුල වෙනුවට - නිවන නැමති ගෙට ගෙවදීම
- අත්හළ විවාහ මංගල්‍යය වෙනුවට - ඵල සමාපත්ති නැමති විවාහ මඟුලට පිවිසීම

(කරුණු වශයෙන් ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න)

*ලකුණු 05යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iv) අපූර්ව උපමා නිර්මාණයේ දී කතුවරයා දැක් වූ දක්ෂතාව ඡේදය ඇසුරෙන් විමසන්න.

අපූර්ව උපමා භාවිතය

- ★ පෙරළී හෙන්ට තිබූ දෙයක් නො හෙන ලෙස තනා තබා ගන්නා සේ
- ★ යම් සේ ලේනෙක් තමා තරම් කෙනෙකුන් තමාට සතුරු ව ආ කල තමාගේ නඟුට කුප්පවාලා එයින් ගසාලා පහ කෙරේ ද
- ★ යම් සේ දිවි දෙනෙක් කෙතෙක් වුවත් එක වරෙක වදන පැටවුන් මුත් දෙවන මුරයේ නොවදා ද, එක මුරයෙන් ම වඳ වේ ද
- ★ යම් සේ දිවියා ගොදුරු අල්වා ගත් කලට වමැළැයෙන් හුණු ගොදුරු නො කා ද ආදී වශයෙන් ඡේදයේ සඳහන් උපමාවල ඖචිත්‍යය පිළිබඳ ව දක්වා තිබිය යුතු ය.

*ලකුණු 10යි*

*මුළු ලකුණු 25යි*

## III කොටස

මෙම කොටසෙන් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.
(පිළිතුර වචන **150ට නො අඩු** විය යුතු ය.)

4. කුස කුමරු තමන් හමුවේ ඇති අභියෝග ජය ගැනීම සඳහා කටයුතු කළ ආකාරය නිදසුන් සහිත ව විස්තර කරන්න.

★ කුස කුමරුට ඇති වු/ එල්ල වූ අභියෝග

(i) විරූපිභාවය

(ii) විවාහ වීමට බල කිරීම

(iii) ඔවුනොවුන් දිවා කාලයේ දී නොදක්නා නිසා කුස තමා කවරෙක් දැයි පබාවතියට අවබෝධ කරවීමට දරන ප්‍රයත්නය

(iv) කුස රජු හැර ගිය පබාවතිය නැවත තමන් කෙරෙහි නම්‍ය කර ගැනීම

★ අභියෝග ජයගත් අයුරු

(i) මහ බෝධිසත්වයෝ තමන් නුවණැති හෙයින් සියලු ශිල්පයන් ආචාරීන් කෙනෙකුන්ගෙන් නොඉගෙන සිය නුවණින් ම දැන නිමවූහ...... ආදී වශයෙන් විරූපී බව ජය ගැනීම සඳහා තම දක්ෂතාවන් දියුණු කර ගැනීමට කටයුතු කිරීම

WWW.OLEVELAPI.COM

(ii) "මෙබඳු රූප ශ්‍රී ඇති කෙනෙකු ලදින් නම් පාවා ගනිමි" යයි පවසමින් විවාහ නො වී සිටීමට උත්සාහ දැරීම

(iii) රජකම මවට පවරා දී මදු රටට ගොස් සිටිමින් වෙස්වලා ගෙන දුෂ්කර ව සිට පබාවතියට සමීප වී ඇයගේ කැමැත්ත ලබා ගැනීමට උපක්‍රමශීලි ව කටයුතු කිරීම නිදසුන් සහිත ව දක්වා තිබිය යුතු ය.

**(අවම වශයෙන් අවස්ථා තුනක්වත් දැක්විය යුතු ය. එයට වඩා නිදසුන් දක්වා ඇති අවස්ථාවක දී සමස්තය සඳහා වැඩි ලකුණක් ප්‍රදානය කිරීම මැනවි.)**

*ලකුණු 15යි*

*නිදසුන් - ලකුණු 03යි*

*විස්තරය - ලකුණු 12යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

5. වෙසක් පහන කතුවරයා ළමා මනස නිරූපණය කිරීමෙහි ලා දැක්වූ කුසලතාව නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

★ ළමා මනස නිරූපණය කිරීමෙහිලා වෙසක් පහන කතුවරයා දැක්වූ කුසලතාව

- දරුවන් තම කැමැත්ත ඉටුකර ගැනීමට උනන්දු වීම

  වෙසක් පහන සෑදීමට මවගේ අනුබල නොලැබුණු නමුත් කථකයාත් නැගණියත් අයියා ඊට මෙහෙය වූ බව.

- කුඩා ළමුන් නිතර දබර කර ගැනීම හා යහළු වීම.
  නැගණිය හිඳ සිටි තැනින් නැගිට කථකයා පසුපසට පැමිණ ඔහුගේ හිසට දැඩි පහරක් දී දිව යාම.
  නැවත නැගණිය කථකයා වෙත පැමිණ වෙසක් කූඩුව බලන්න යාමට කතා කිරීම.

- තමා ප්‍රිය කරන දේ තමාට ම හිමිකර ගැනීමට උත්සාහ දැරීම
  කථකයාත් නැගණියත් දෙදෙනා ම අයියා සැස තබන උණ පතුරු තමා ළඟින් තබා ගැනීමට උත්සාහ දැරීම.
  කථකයාට හොරෙන් නැගණිය උණ පතුරු තම දෙකකුල් යට සඟවා ගැනීම

- නංගි අලුත් ගවුමක් ඇඳ, මුහුණේ පියරු දමා පැමිණි අවස්ථාවේ දී කථකයා තුළ ඊර්ෂ්‍යාවක් හටගැනීම නිසා ඔහු ක්‍රියා කරන ආකාරය
- අයියාගේ අත පිළිස්සුණු අවස්ථාවේ දී අයියා මිය යන්නට ඇතැයි උපකල්පනය කිරීම

  වැනි අවස්ථා මගින් ළමා සිතුවිලි නිරූපණය කර ඇති ආකාරය දක්වා තිබිය යුතු ය.

*ලකුණු 15යි*
*නිදසුන් - ලකුණු 03යි*
*විස්තරය - ලකුණු 12යි*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

6. අලගියවන්න මුකවෙටි කවියා සමාජයේ යහ පැවැත්ම සඳහා **සුභාෂිත** කාව්‍යය මඟින් දැරූ උත්සාහය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

★ අන් අයගේ යහපත සඳහා කැපවී කටයුතු කිරීම

★ බුද්ධිමත්භාවය

★ කළගුණ සැලකීම

★ සත්‍යවාදී බව

★ ආදර්ශවත් බව

★ සුදන දුදන ස්වාභාවය හඳුනා ගෙන සමාජ කටයුතු සිදුකිරීම ඇතුළු නිර්දිෂ්ට පද්‍යාවලියෙන් සමාජයේ යහපැවැත්ම සඳහා අවශ්‍ය වන උපදෙස් ලබා දීමට කවියා දරා ඇති උත්සාහය නිදසුන් සහිත ව විස්තර කර තිබිය යුතු ය.

*ලකුණු 15යි*
*නිදසුන් - ලකුණු 03යි*
*විස්තරය - ලකුණු 12යි*

7. "**තුංමංහන්දිය** නවකතාවේ අබිලිංගේ චරිතය මඟින් ගැමි කලා ශිල්පියකුගේ භූමිකාව මැනවින් නිරූපණය වේ." විමසන්න.

අබිලිංගේ චරිතය මඟින් ගැමි කලා ශිල්පියෙකුගේ භූමිකාව නිරූපණය වේ.

★ පිරිත් මණ්ඩප, මඟුල් මඩු සැරසීම, අවමඟුල් තොරණ තැනීම ආදී සැරසිලි, කලා කටයුතු මුදල් අපේක්ෂාවෙන් තොර ව සිදු කිරීම

★ කරත්ත ලොරි පින්තාරු කිරීම, මල් පෝච්චි සෑදීම, ගෙවල් ඩිස්ටෙම්පර් කිරීම වැනි ඕනෑ ම කටයුත්තක් ඔහුට සිදුකළ හැකි වුව ද එමඟින් වැඩි මුදලක් උපයන්නට උත්සාහ නොගැනීම

★ සඳ කිඳුරු වැනි නාට්‍ය රඟ දැක්වීම මඟින් අබිලිං ආත්ම තෘප්තියක් ලැබීම

★ ඔහු කරත්ත මඩුවේ කරත්ත ඉතා හොඳින් පින්තාරු කිරීම

WWW.OLEVELAPI.COM

★ ගැමියන්ගේ මඟුල් කටයුතුවල දී මඟුල් මඩුව සැරසීම ආදී කටයුතු කිරීම

★ ඔහු තම නිවසේ දී අවශ්‍ය දෑ සූදානම් කර ගෙන අදාළ තැනට ගෙන ගොස් සැරසිලි කළ ද ඒ වෙනුවෙන් මුදලක් අය නොකර කඩදාසි සඳහා වැය වන වියදම පමණක් අයකර ගැනීම.

★ පොල්කොළවලින් ගල් පෙට්ටි සෑදීම, රෑනන් සෑදීම, බස්තම්වල කැටයම් කැපීම වැනි කලා කටයුතු සිදුකිරීම.

වැනි සිද්ධි ඇතුළත් කරමින් පිළිතුර සපයා තිබිය යුතු ය.

*ලකුණු 15යි*
*නිදසුන් - ලකුණු 03යි*
*විස්තරය - ලකුණු 12යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...